දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක- 2010/25

ඩී8/විවිධ
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ-09
2010.08.15

සියලුම බන්ධ නාගාර අධිකාරී වරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරී වරුන් වෙත,

<u>විදේශ නිවාඩු ලබා ගැනීම</u>

සියලුම බන්ධනාගාර නිලධාරීන් සහ නිලධාරිනියන් රැකියාවකට හෝ වෙනයම් කරුණක් සඳහා විදේශ ගත වන්නේ නම් ඒ සඳහා ඔවුන් විසින් ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 1:4 වගන්තිය අනුව හැකි සෑම විටකම එම නිවාඩුව ආරම්භ වන දිනට මාස 03 කට අඩු නොවන කාලයකට ප්‍රථමයෙන් විදේශ නිවාඩු අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

02) එසේ කළ නොහැකි වන අවස්ථාවලදී පමණක් අවම වශයෙන් සති 03 කටවත් ප්‍රථමයෙන් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ හැකි වන සේ තම අයදුම් පත ඉදිරිපත් කළ යුතු බව තරයේ අවධාරණය කරමි.

03) තවද, එම විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලැබීමෙන් පසු ආයතන සංග්‍රහය පරිදි අවශ්‍ය ගිවිසුම් පත් හා බැඳුම්කර නිසියාකාරව සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් මෙරටින් බැහැර විය යුතු වේ.

04) මෙපරිදි විධිමත් ලෙස නිවාඩු අනුමත කර නොගෙන විදේශ ගතවන නිලධාරීන් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කිරීමට සිදුවන බව වැඩිදුරටත් දන්වන අතර ඔවුන් සම්බන්ධයෙන් නැවත සේවය ලබා දීමට මැදිහත් නොවන බවද දන්වා සිටිමි.

05) මේ අනුව සියළුම නිලධාරීන් මනාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්න.

වී.ආර්.සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජ්
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්